# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක **2468/16 – 2025** දෙසැම්බර් මස **23** වැනි අඟහරුවාදා – **2025.12.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/211.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

අංක 2455/03 දරන හා 2025.09.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් 1. සියඹලාපේ, මීගහවත්ත, දේවාල පාර, අංක 65/7/8 හි පදිංචි ජී.එල්. නිමල් වීරසිරි මයා 2. රාජගිරිය, මාදින්නාගොඩ, අංක 714/ඩී හි පදිංචි පී.කේ. ප්‍රියන්ත සූරසේන මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 13, බ්ලූමැන්ඩල් පාර, අංක 223 හි පිහිටි උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 09/2024 දරන හා 2025.08.07 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඩී. තිස්ස යාපා මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 09/2024 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2026.09.21 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 දෙසැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 045973 – 17 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

**(3 වන නියෝගය)**

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : උපාලි පුවත්පත් (පුද්.) සමාගම,
223, බ්ලූමැන්ඩල් පාර,
කොළඹ 13.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2025.09.22 දිනැති අංක 2455/03 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද ජී.එල්. නිමල් වීරසිරි, පී.කේ. ප්‍රියන්ත සූරසේන ඇතුළු 11 දෙනා සහ උපාලි පුවත්පත් (පුද්.) සමාගම බැඳී සිටින්නා වූ ද 2025.08.07 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන

පිටපත : (අනෙක් පාර්ශ්වය)

ජී.එල්. නිමල් වීරසිරි - අංක 65/7/8, දේවාල පාර, මීගහවත්ත, සියඹලාපේ.
පී.කේ. ප්‍රියන්ත සූරසේන - 714/ඩී, මාදින්නාගොඩ, රාජගිරිය.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සැම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න).

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 12-0219

මගේ අංකය: IR/COM/01/2021/149.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.06.03 දිනැති හා අංක 2439/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.05.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගලිගමුව නගරය, කොබ්බෑවල, දෙමටගොල්ල, අංක 82/1 ඒ හි පදිංචි අයි.පී.පී. උපුල් කුමාර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 38/2025 හා 2025.10.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 දෙසැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදී

ගොනු අංකය - IR/COM/01/2021/149
නඩු අංකය - A/38/2025

*පළමු පාර්ශ්වය*
අයි.පී.පී. උපුල් කුමාර මහතා
අංක 82/1A,
දෙමටගොල්ල,
කොබ්බෑවල,
ගලිගමුව නගරය,
සහ
දෙවන පාර්ශ්වය
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
අංක 34,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
කොළඹ 02.
දෙපාර්ශ්වය අතර පවතින කාර්මික ආරවුල

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.
අයි.පී.පී. උපුල් කුමාර

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.
කළමනාකාරිණී (නීති)
රසංගිකා මදූෂානි විජේමාන්න මිය.
සහකාර සාමාන්‍යාධිකාරි
මානව සම්පත් සංවර්ධන හා පරිපාලන
වසන්තා ජයවර්ධන මිය.
කළමනාකාර සහකාර,
ඩෙෆ්නි රොෂාන් මහතා.
රජයේ නීතිඥ
ඔවිනි බුලත්ගම මිය.
රජයේ නීතිඥ
විමාෂා විදානගමගේ මිය.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
මානව සම්පත් කළමනාකරණ හා පාලන
ලලිත් එදිරිසිංහ මයා.
නියෝජ්‍ය සම්පත් කළමනාකරු පරිපාලන
නලින්ද්‍ර සිල්වා මහතා.

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ගරු ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව 2025 මැයි මස 26 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.05.26 වැනි දින හා අංක IR/COM/01/2021/149 ලිපියෙන් ඒ.බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර, උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.
මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද මහත්මිය විසින් නිකුත් කරන ලද 2025.05.15 වැනි දින ඇයගේ අංක IR/COM/01/2021/149 ලිපියෙන් “ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ අයි.පී.පී. උපුල් කුමාර මහතාට 2012.03.12 සිට නියමිත වැටුප් තලයේ නොපිහිටුවීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ”

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/38/2025 යටතේ කාර්මික අධිකරණයට දෙපාර්ශ්වයම කැඳවා විභාග පවත්වා ඇත.

| | |
|---|---|
| 2025.06.05 | 2025.08.13 |
| 2025.06.12 | 2025.08.25 |
| 2025.06.25 | 2025.09.16 |
| 2025.07.08 | |
| 2025.07.29 | |

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය**

මෙම නඩුව A/38/2025 යටතේ 2025.06.05 සිට 2025.09.16 දක්වා කාර්මික අධිකරණයේ පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම බේරුම්කරණයට අදාළව අධිකරණය ඉදිරියේ ලබා දුන් සාක්ෂි හා විභාගය අවසන් වීමෙන් පසු ලබා දුන් ලිඛිත දේශන මෙන්ම අදාළ සලකුණු කරන ලද ලේඛනද දෙවන පාර්ශ්වය විසින් ලබාදුන් විවිධ තොරතුරු අඩංගු ලේඛන මාගේ විශේෂ අවධානයට යොමු විය. තවද දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරු විශ්‍රාම යාමෙන් පසු මෙවැනි ඉල්ලීමක් කිරීමට හැකියාවක් නැතැයි නැගූ තර්කයද පදනම් විරහිත බැවින් එම මතයද මා විසින් බැහැර කරන ලදී.

මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරු වන අයි.පී.පී. උපුල් කුමාර මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රජා සංවර්ධන සහකාර ix තනතුර සඳහා 1999.05.03 වැනි දින සිට වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගෙන ඇත. 2000.03.01 වන දින මෙම තනතුරේ ඉල්ලුම්කරු ස්ථිර කර ඇත. (පිටු අංක 10) 2024.03.31 වන දින ඉල්ලුම්කරු වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා විශ්‍රාම ගොස් ඇත. ඔහු ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ එකම ශ්‍රේණියේ අවුරුදු 10ක සේවා කාලය සම්පූර්ණ කරන ලද සේවකයන්ට උසස් වීම් ලබාදීමට අදාළව නිකුත් කර ඇති අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 5757 හා 5759 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව 2012.01.24 වන දිනට අදාළ සුදුසුකම් සපිරි සේවකයින්ට උසස් වීම් ලබා දුන් බවත්, එහෙත් ඉල්ලුම්කරුට මෙම උසස්වීම නොලැබුන බවත් ඉල්ලුම්කරු 2025.06.05 වැනි දින මෙම කාර්මික අධිකරණයේදී සාක්ෂි දෙමින් පවසා ඇත.

මෙම උසස්වීම්වලට අදාළව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නාම ලේඛනයක් පිළියෙල කර ඇති අතර එම ලේඛනයේ නම් 39ක් ඇතුළත් වේ. ඉල්ලුම්කරුගේ නම එහි අනු අංක 30 යටතේ සඳහන්ව ඇත. (ඇමුණුම 03)

එහෙත් මෙම උසස්වීම තමාට නොලැබුන බව ඉල්ලුම්කරු ප්‍රකාශ කල අතර අදාළ උසස්වීම ලැබුනේ නම් තමාට 2012.01.24 සිට viii ශ්‍රේණි උසස්වීම් අදාළ වන බව ප්‍රකාශ කර ඇත. එම උසස් වීම තමාට ලැබුනේ අවුරුදු 15කට පසුව බවත් මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත අභියාචනා කළත්, ඒවාට පිළිතුරු නොලද බව ප්‍රකාශ කර ඇත. (ඇමුණුම් 05, 06, 07 අනුව ඒ බව සනාථ වේ.)

මෙම බේරුම්කරණයේදී දෙවන පාර්ශ්වය විසින් 2012.11.13 ලිපිය මගින් පළමු පාර්ශ්වයේ අවශ්‍යතා මත තාක්ෂණ සහකාර ලෙස තනතුරු නාමය සංශෝධනය කර ඇති බව සිය පළමු ප්‍රකාශය මගින් ප්‍රකාශ කළ ද එය අසත්‍ය බව පෙනී යයි. එනම්, ඔහු වෙත නිකුත් කළ 2012.11.13 ලිපියේ සඳහන් ආකාරයට “2012.02.17 දින පැවැති ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඔබගේ තනතුරු නාමය තාක්ෂණ සහකාර ලෙස සංශෝධනය කරන බව සතුටින් දන්වමි” යනුවෙනි (පිටු අංක 31). ඒ අනුව දෙවන පාර්ශ්වයේ පළමු විස්තර ප්‍රකාශයේ 5(අ) ඡේදයේ අසත්‍ය ප්‍රකාශයක් බවට නිගමනය කරමි.

එමෙන්ම 2012.11.21 වැනි දින පළමු පාර්ශ්වය විසින් කෑගල්ල දිස්ත්‍රික් කළමනාකරු මගින් දෙවන පාර්ශ්වය වෙත යොමු කරන ලද ලිපියේ අංක 02 මගින් පළමු පාර්ශ්වය සමඟ එකම දිනයේ සේවයට බැඳුන ප්‍රජා සංවර්ධන නිලධාරීන්ට උසස්වීම් ලබාදී ඇති බවත් අංක 05 මගින් වසර 10ක සේවය සම්පූර්ණ කර ඇති ඉල්ලුම්කරුට තාක්ෂණ සහකාර ලෙස නව පත්වීමක් ලබා දී ඇති බවත්ය.

මේ ගැන අවධානය යොමු කර වසර 10 ක සේවයට අදාළව ලබා දුන් උසස්වීම සහ එයට අදාළ වැටුප සංශෝධනය කර තාක්ෂණ සහකාර තනතුර ලබාදීමට කටයුතු කරන ලෙසට ඉල්ලුම්කරු දෙවන පාර්ශ්වයෙන් ඉල්ලා ඇත. (පිටු අංක 69)

එමෙන්ම කෑගල්ල දිස්ත්‍රික් කළමනාකරුගේ 2009.12.07 ලිපියෙන් දෙවන පාර්ශ්වයේ උපදෙස් පරිදි ඉල්ලුම්කරු තාක්ෂණ නිලධාරි තනතුරේ රාජකාරි ආවරණය සඳහා යොදවා ඇති බව නිරීක්ෂණය වේ. (පිටු අංක 74)

මේ අනුව නිගමනය වන්නේ පළමු පාර්ශ්වය දෙවන පාර්ශ්වයේ තීරණය හා නිගමනයන්ට අනුව තාක්ෂණ සහකාර ලෙස තනතුරු නාමය සංශෝධනය කළ බවයි.

එමෙන්ම, තාක්ෂණ නිලධාරි තනතුරේ පුහුණුව සඳහා මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන J.A.W.K. ජයවර්ධන මහතාගේ සටහනක් මගින් ඉල්ලුම්කරු සහභාගි කරවා ඇති බව අංක 76 ලිපිය මගින් සනාථ වේ. මේ අනුව දෙවන පාර්ශ්වයේ නියෝග මත අදාළ පුහුණුවට ඉල්ලුම්කරු සහභාගි වී ඇති බව නිගමනය කරමි. (පිටු අංක 76)

එමෙන්ම පළමු පාර්ශ්වය වෙත සාමාන්‍යාධිකාරි විසින් නිකුත් කරන ලද 2012.11.13 ලිපියේ II වන ඡේදය යටතේ වසර 10ක් සම්පූර්ණ වීමෙන් ඔබට හිමිවන උසස්වීම ද සැලකිල්ලට ගෙන යනුවෙන් දෙවන පාර්ශ්වය සඳහන් කර ඇතත් දෙවන පාර්ශ්වය විසින් තාක්ෂණ සහකාර නව බඳවා ගැනීම හා පළමු පාර්ශ්වයේ වැටුප අතර වෙනසක් නොමැති බව 2025.06.25 වැනි දින බේරුම්කරණයේ සාක්ෂි ලබාදෙමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් කළමනාකරණ සහ පාලන ලලිත් එදිරිසිංහ මහතා පිළිගෙන ඇත. මේ අනුව වසර 10 කින් ලැබිය යුතු උසස්වීම මෙම තනතුරු නාමය වෙනස්කිරීම හා ඊට අදාළ වැටුප් තලය මගින් විසදී ඇතැයි යන දෙවන පාර්ශ්වයේ උපකල්පනය පිළිගත නොහැකි බවට නිගමනය කරමි.

2025.06.25 වැනි දින කාර්මික අධිකරණයේ සාක්ෂි ලබා දුන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් ලලිත් එදිරිසිංහ මහතා දෙවන පාර්ශ්වයේ නීතිඥ මහත්මියගේ මෙහෙයවීම මත සාක්ෂි ලබා දෙමින් ඉල්ලුම්කරු නිත්‍ය තනතුරේ සේවය කරන ගමන්ම තාක්ෂණ සහකාර තනතුරේ රාජකාරි ආවරණය කිරීමට පත්කළ බව කියා සිටී. (සාක්ෂි සටහන් 06 වන පිටුව)

එමෙන්ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්කරුට අයදුම්පතක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොමැති නිසා ඉල්ලුම්කරු මෙම තනතුරට අයදුම් නොකළ බව කියා සිටී. (2025.06.25 සාක්ෂි සටහන් පිටු අංක 10)

ප්‍ර : සාක්ෂිකරු මෙතන තිබෙන ප්‍රශ්නය තනතුරු නාමය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නොවේ. සාක්ෂිකරුගේ අවධානය දෙවන ඡේදයට යොමු කර සිටී. ඔබ කලින් දරන ලද තනතුරේ වසර 10ක් සම්පූර්ණ වීමෙන් ඔබ්බට ඔබට හිමිවන ඊළඟ උසස් වීමද සැලකිල්ලට ගෙන කියලා.

උ : එහෙමයි. එය තමයි මම කලින් පැහැදිලි කරන්න හැදුවේ ස්වාමීණි. ප්‍රජා සංවර්ධන සහකාර තනතුර 9 වන ශ්‍රේණියට අදාළ උසස්වීම තමයි 8 වන ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරේ ආරම්භක පියවර තමයි. vii ශ්‍රේණියේ ii (ආ) පන්තිය

මේ අනුව නිගමනය වන්නේ ඉල්ලුම්කරු උපුල් කුමාර මහතාගේ අදාළ තාක්ෂණ සහකාර පත්වීම් සඳහා අලුතින් බඳවා ගන්නා ලද 7 දෙනාගේත් වැටුප් අතර වෙනසක් නොමැති බවයි. එය සාක්ෂිකරු අධිකරණයේ පිළිගෙන ඇත.

**නිගමන හා නිර්දේශ**

මෙම බේරුම්කරණයේදී ඉදිරිපත් වූ කරුණු අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රජා සංවර්ධන සහකාර ix වශයෙන් සේවය කළ අයි.පී.පී. උපුල් කුමාර මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 5757 හා 5759 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ එකම ශ්‍රේණියේ අවුරුදු 10ක් සේවය සපුරා ඇති සේවකයන්ට උසස්වීම් ලබා දීමේදී ඔහු සමඟ සේවයට බැඳුනු අනිකුත් ප්‍රජා සංවර්ධන සහකාර ix අයවලුන් හට ලබා දුන් viii වන ශ්‍රේණියට අදාළ උසස්වීම ඉල්ලුම්කරු වන අයි.පී.පී. උපුල් කුමාර මහතාට ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කරන අතර එම උසස්වීම අයි.පී.පී. උපුල් කුමාර මහතාට ද 2012.01.24 දින සිට හිමි වන බවට නිශ්චය කර නිගමනය කරමි.

ඊට අදාළ වැටුප් තලය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 විධිවිධාන ප්‍රකාරව සහ කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල්ගේ 2013.06.06 උපදෙස් වලට සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා අවශ්‍ය පියවර ක්‍රියාත්මක කළ යුතු වේ. මෙයට අදාළ වැටුප් තලයේ පිහිටුවා හිඟ වැටුප් හා හිඟ අර්ථසාධක අරමුදල් ගෙවීමට කටයුතු කල යුතු බවට නියෝග කර නියම කරමි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 8625 ට අනුව අවුරුදු 15 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ සේවකයන්ට උසස්වීම් ලබා දීමේ දී කාර්මික සහකාර උපුල් කුමාර මහතා 2017.03.08 වැනි දින සිට MA2-2- සේවා ගණයේ ii ශ්‍රේණියට උසස් කර ඇත. එහෙත් ඉල්ලුම්කරු මෙම ප්‍රදානය මගින් viii වන ශ්‍රේණිය ලබා දෙන බැවින් එය සැලකිල්ලට ගෙන ඔහුට අදාළ ශ්‍රේණිය වන්නේ MA2-2 සේවා ගණයේ i වන ශ්‍රේණියට උසස් කළ යුතු බැවින් එසේ කටයුතු කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කටයුතු කළ යුතු බවට නිශ්චය කර නිගමනය කරමි. මේ අනුව හිඟ වැටුප් හා අර්ථ සාධක අරමුදල් ගණනය කර ඉල්ලුම්කරුට ගෙවිය යුතු වේ.

මෙම අධිකරණයේ ඉල්ලුම්කරු විසින් සලකුණු කරන ලද පැ. 05 ලේඛනයට අනුව පිටු අංක 257හි හිඟ මුදල වශයෙන් ඉල්ලුම්කරු ගණනය කර ඇති මුදල සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණයේදී කිසිදු හබ කිරීමක් සිදු නොකළ බවද සඳහන් කරමි.

එමෙන්ම ඉල්ලුම්කරුගේ අවසාන ලිඛිත දේශනයේ මෙම මුදල පැහැදිලිව ගණනය කර ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් එම මුදල වන රුපියල් හය ලක්ෂ දසදහස් එකසිය පනස් අටක මුදල (රු. 610158.00) මුදල දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු වන අයි.පී.පී. උපුල් කුමාර මහතාට ගෙවිය යුතු බවට නිගමනය කර නියම කරමි.

ඉහත නියමයන්ට අනුව ඉල්ලුම්කරු වන අයි.පී.පී. උපුල් කුමාර මහතා සම්බන්ධයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා කටයුතු කර ඔහුට හිමි උසස්වීම් ලබාදී ගෙවිය යුතු හිඟ වැටුප් හා හිඟ අර්ථසාධක අරමුදල් ගෙවිය යුතු බවට නිශ්චය කර නියම කරමි.

**ප්‍රදානය**

සැම විටම සාධාරණ හා යුක්ති සහගත තීරණයක් ලබා දීමට බැඳී සිටින කාර්මික අධිකරණය හා බේරුම්කරණය ඉල්ලුම්කරු වන අයි. පී.පී. උපුල් කුමාර මහතාට අසාධාරණයක් සිදු වී ඇති බැවින් සාධාරණය ඉටු විය යුතු බවට තීරණය කරමි. ඒ අනුව මෙම ප්‍රදානයේ ඇතුලත් උසස්වීම් ලබා දීමටත් එම මහතාට ගෙවිය යුතු හිඟ වැටුප් හා හිඟ අර්ථසාධක අරමුදල් හා සියලු දීමනා ගෙවීම යුක්ති සහගත ප්‍රදානයක් බවට සහතික කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී මසක් ඇතුළත ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් එම ප්‍රදානය ක්‍රියාත්මක කර එසේ ක්‍රියාත්මක කළ බව දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත ලිඛිතව දැනුම්දිය යුතු බවටද නියෝග කර නියම කරමි.

**ඒ.බී. හේරත්,**
බේරුම්කරු.

2025 ඔක්තෝබර් මස 10 වැනි දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදී ය.

EOG 12-0220

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.